### Teenager finds new best friend...in a white dove

# This dove is in love with me.....Help!

# මේ පරවියා මට පැණි... මාව බේරගන්න!

**By Ross McGuinness**




Teenager Rebekah Horsfield has a new best friend and while there is nothing unusual about a girl getting NBF, hers is a feathered friend - a dove called Snowy.

Snowy joined her on a walk home from school one day and hasn't left her side since. He helps her with her homework, shares her tea and waits for her to come home from school.

Rebekah told how she came across the bird last week, sitting on the pavement. "At first, I thought it couldn't fly and it was just sat there watching people walking past " said the 13-year-old from Bradford.

" It was sniffing around my feet and then it flew up on to my shoulder. I didn't mind him being there, so I just started walking - he walked me home."

Rebekah's mother, Laraine, 47, said the pair were becoming inseparable. " It's comical really," she said. " When Rebekah is on the internet, it perches on top of the computer. When we are sitting down to eat, it wants to join in and we give it some bird food, then goes back to Rebekah and sits on her shoulder. We think it might be a magician's pet, it's amazing."

**ළා**බාල එමෙන්ම ඉතා සුන්දර පෙනුමැති පාසැල් ශිෂ්‍යාවක වන රිබෙකා හෝස්ෆීල්ඩ් ට මේ නොබෝදා අළුත් යහළුවෙකු හමුවිය. තරුණ ගැහැණු ළමයෙකුට අළුත් යහළුවෙකු හමුවීමේ පුදුමයක් නැත. එහෙත් මේ නව මිතුරා පියාපත් සහිත කෙනෙකි. සුදු පරෙවියෙකි. ඇය ඌට නම තබා ඇත්තේ ස්නෝවි යනුවෙනි. හේතුව මිතුරා හිම කැටියක් මෙන් සුදුම සුදු නිසා ය.

දිනක් රිබෙකා පාසැල ඇරී ගෙදර එනවිට මහ මගදී හමු වූ මේ පරෙවියා ඇයගේ පස්සෙන්ම ගෙදර ළඟටම ආවේය. ඇය ගෙතුළට යනවිට ගේ ඇතුළටම ආවේය. එදා සිට ස්නෝවි රිබෙකා අත් නොහැරම ඉඳී. ඇය යන යන තැන පස්සෙන් යයි. එංගලන්තයේ බ්‍රැඩ්ෆර්ඩ් පෙදෙසේ පදිංචි දහතුන් වියැති රිබෙකා පක්ෂියා හමුවීම ගැන අසන අසන අයට මෙසේ විස්තර කරයි.

" දවසක් මම පාසැල ඇරිලා ගෙදර එනකොට පරෙවියෙක් උඩින් පියාඹාගෙන ඇවිත් පේව්මන්ට් එකේ වැහුවා. ඒ පාර එහෙමම හෙලවෙන්නෙ නැතුව හිටියා. මම හිතුවා තටු කැඩිලද දන්නෙ නෑ කියලා. මම ළඟට ගියත් අයින්වුණේ නෑ. එයා එහෙම ඉන්දෙද්දී මම එන්න හැරුණා. මෙන්න එතකොට ඇවිත් මගේ උරහිස මත්තෙ වැහුවා. මම හිතුවා මම ඇවිදින කොට පියාඹලා යාවි කියලා. ගියේ නෑ. එහෙම්ම් උරේ උඩ හිටියා. මාත් එක්ක ගේ ඇතුළටම ආවා. ඉතින් ඊට පස්සෙ මෙහේමයි."

රිබෙකාට දැන් ලැබී ඉන්න අළුත් යහළුවා ගැන රිබෙකාගේ මව වන ලැරේන්ටද පුදුමය.

" ඒ දෙන්නා දැන් වෙන් කරන්න බැරි තරමට බැඳිලා " ලැරේන් කියයි.

" දුව ඉන්ටර්නෙට් එක ළඟ වැඩක් කරන-කොට ස්නෝවි ක්ම්පියුටර් එගේ උඩට නැගලා බලාගෙන ඉන්නවා. සමහර වෙලාවට මට හිනහාත් යනවා මේ සතාගෙ හැසිරීම දැකලා. අපි කන්න වාඩි වුනාම එයත් මේසෙට එනවා. එතකොට අපි කුරුළු කෑම දෙනවා. ඒවා කාලා රිබෙකගෙ උරේට නැගලා ඉන්නවා. අපි හිතන්නෙ මේ මැජික් කාරයෙක් ළඟ හිටපු සතෙක් වෙන්න ඇති. ඒකයි මෙච්චර හීලෑ."

ඔව්හු පරෙවියා ගැන එංගලන්තයේ **RSPCA** නමින් හඳුන්වන සත්ව ආරක්ෂක සංගමයට දැනුම්දී ඇත. එතැනින් කියා ඇත්තේ ඌ හිර නොකර නිදහසේ ඉන්න දෙන්න කියාය." දැනටත් නිදහසේ තමයි ඉන්නෙ ඒත් එයා යන්න කැමති නෑ" රිබෙකා කියයි

# ෂම්මි කපූර්ගේ අවසන් ගමන

**ස**ම්ප්‍රදායික හින්දි සිනමාව ඒ ආකෘතියෙන් මුදවා ඊට නව්‍යතාවත් බටහිරට ආටෝපයත් එක්කරමින් බොලිවුඩ් රංගන කලාව ඉහළ තලයකට ඔසවා තැබූ, එසේම හැටේ හැත්තෑවේ දශකයේ තරුණ හදවත් මුසපත් කළ රූපයක් සතුව සිටි ෂම්මි කපූර් නම් ඒ ජනප්‍රිය සිනමා ශිල්පියා ගිය මස අවසන් ගමන් ගියේය. මියෙන විට ඔහු 79 වන වියේ පසුවිය. වසර කීපයක් තිස්සේ වකුගඩු රෝගයෙන් පෙළෙමින් සිටි ෂම්මි අවසාන සති කීපය රෝහල් ගතව සිටි බව කියති.

ඔහු සිනමාවට ආ මුල් කාලයේ රඟපෑ චිත්‍රපට දෙක තුන එතරම් සාර්ථක වූ ඒවා නොවේ. එකල ෂම්මිට ගිනිකූරු රැවුලක්ද තිබුණේය. මුහුණුවර වෙනස් කරන්නට සිතූ ඔහු රැවුල සම්පූර්ණයෙන්ම ගා දමා, කොණ්ඩය පීරන ආකාරයද වෙනස් කළේය. වැඩේ සාර්ථක වීය. ඉන්පසු 1957 දී රඟපෑ මුල්ම චිත්‍රපටය වන තුම්සා නහින් දේඛා බොක්ස් ඔෆිස් වාර්තා බිඳ හෙළමින් ප්‍රදර්ශණය විය. දිල් දේක් දේකෝ නම් ඊළඟ චිත්‍රපටයද එසේම සාර්ථක වූයේය. එසේම ඒ චිත්‍රපට දෙක ෂම්මි කපූර් නම් නළුවාට ස්ථිර ජනප්‍රියත්වයක් බොලිවුඩ් සිනමාව තුළ තහවුරු කළේය. එවක් පටන් ඔහු රඟ පෑ කුමන චිත්‍රපටයක් වුවද රසික ජනතාව ඉහළින් පිළිගත්හ. මුදල් අතින් සාර්ථක වීය.

හැටේ දශකය බටහිර රොක් ඇන්ඩ් රෝල් යුගයයි. එල්විස් ප්‍රෙස්ලිගේ පැද්දෙන පෙරලෙන නැටුම් හා ගායනා ජනප්‍රිය වෙමින් ආ සමයයි. ඒ විලාසිතාව තම රඟපෑමට එක්කරන්නට ෂම්මි සමත් විය. ඒ ඇඟ සලිත කරන නැටුම් කලාව හින්දි සිනමාවට එක් කළේ ෂම්මි කපූර්ය. එසේම ඒ රංගන කලාව එවක් පටන් ඔහුගේ නොමැකෙන මුද්‍රාවද වීය. පසු කලක ආ නළුවෝද ෂම්මිගේ රංගන කලාව අනුගමනය කරන්නට වූහ.

ඔහුගේ මුල් බිරිඳ ජනප්‍රිය නිළියක වන ගීතා බාලිය. 1965 දී ඇය මියගියාය. 1969 දී ඔහු යළිත් නීලා දේවී නම් නිළිය හා විවාහ වූයේය. ඔහුට පුතෙක්ද දුවක්ද සිටිති.

කපූර් පවුලේ සියළු දෙනාම මෙන් ෂම්මි ද සිය ජීවිතය කැප කළේ ඉන්දීය සිනමාවේ උන්නතිය සඳහාය. ලක්ෂ සංඛ්‍යාත ජනකායක් මුසපත් කළ ඔහු යන්නටම ගියේය.

♦ දයා





ගිය වසරේ උත්සවයකට පැමිණි ෂම්මි

**1961** දී ෂම්මි කපූර් සිය ප්‍රථම වර්ණ චිත්‍ර පටය වන ජංග්ලී හි රඟපෑවේ සහිරා බානු ද සමඟය. ජංග්ලී ඉන්දියාවේ පමණක් නොව විදේශ රටවල් රාශියක ජනප්‍රිය වූයේ ය. ඒ ජනප්‍රියත්වය නිසාම අවුරුදු කීප යක් තුළ ඔහුට චිත්‍රපට සීයකට වඩා රඟ පාන්නට ලැබුණේ ය. ජංග්ලී චිත්‍රපටයේ ගීත අද ද රසික ජනතාව අතර ජනප්‍රිය ය. මෙය ශ්‍රීලංකාවේ බොරැල්ලේ රිට්ස් සිනමා හලේ නොකඩවා මාස ගණ නක් දිව්වේය. රසික යෝ අදත් ජංග්ලී ගැන කතා කරති.



ෂම්මි කපූර් සහ සහිරා බානු ජංග්ලී චිත්‍රපටයේ ජවනිකාවක (1961)

